සැ. යු. - 2010.04.16 වැනි දින පළ වූ අංක 1,650 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,651 - 2010 අප්‍රේල් මස 23 වැනි සිකුරාදා - 2010.04.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 986 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අප්‍රේල් මස මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අප්‍රේල් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# පළාත් පාලන නිවේදන

## රත්තොට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 ‘2’ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24: 2 වගන්තිය යටතේ 2009.10.30 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV‘ආ’ කොටසේ සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සඳහා හිමිකම් හෝ විරුද්ධතාවයක් ඉදිරිපත් කර නොමැති බැවින්, පහත උපලේඛනයේ 1 හා 2 හි පෙන්නුම් කර ඇති මාර්ග එකී පනතේ 24(5) වගන්තිය අනුව රත්තොට ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති මංමාවත් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ටී. ඩී. ජයතිස්ස,
සභාපති,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2010 මාර්තු මස 31 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

රත්තොට ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත්කරන මාර්ග පිළිබඳ විස්තර

| *අංක* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ පටන් ගැන්ම හා අවසානය* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මායිම්* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | *වමට* | *දකුණට* |
| | | | | | | *ආරම්භයේ සිට :-* | *ආරම්භයේ සිට :-* |
| 1 | රත්තොට මැල්ලගොල්ල අන්නාසිවත්ත පාර | රත්තොට | මාතලේ-රත්තොට ප්‍රධාන මාර්ගයේ රත්තොට හින්දු විද්‍යාලයට පිවිසෙන ස්ථානයෙන් පටන්ගෙන (ලොරි රථගාල අසලින්) කොඩිප්පිලි මහතාගේ නිවස අසලින් ගමන් කරයි<br>*අවසානයට*<br>එසේ ආරම්භවන මාර්ගය ඉදිරියට ගොස් මාතලේ රත්තොට ප්‍රධාන මාර්ගයේ උසාවිය ඉදිරිපිටින් (ගම් සභා ළිඳ) අසලින් පටන්ගන්නා අන්නාසි වත්ත මාර්ගයේ ප්‍රගීත් වීරසේකර මහතාගේ නිවස අසලින් අන්නාසි වත්ත මාර්ගයට සම්බන්ධ වේ. | මාතලේ රත්තොට ප්‍රධාන මාර්ගයේ සිට (ආරම්භය) කොඩිප්පිලි මහතා ගේ නිවස දක්වා අඩි 560<br>කොඩිප්පිලි මහතා ගේ නිවස අසල සිට අන්නාසිවත්ත මාර්ගය දක්වා අඩි 1381<br>ඒ අනුව මාර්ගයේ සම්පූර්ණ දිග අඩි 1941 | මාර්ගය ආරම්භයේ සිට කොඩිප්පිලි මහතාගේ නිවස අසල දක්වා (තුංමං හන්දිය දක්වා) අඩි 19<br>කොඩිප්පිලි මහතාගේ නිවස අසල සිට (තුංමං හන්දිය) අන්නාසි වත්ත මාර්ගයට සම්බන්ධවන ස්ථානය දක්වා අඩි 8 | ජෝෂප් මහතා ගේ ඉඩම<br>රත්තොට විජය ස්ටෝර්ස්ට අයිති ඉඩම<br>වේලු මහතාගේ ඉඩම<br>ක්ලේමන් මහතා ගේ ඉඩම<br>ජෝෂප් මහතාගේ ඉඩම<br>අශෝක් කුමාර් මහතාගේ ඉඩම<br>රත්තොට විජය ස්ටෝර්ස්ට අයිති ඉඩම<br>ජෝෂප් මහතාගේ ඉඩම<br>ජී. ජී. ගුණවතී මහත්මියගේ ඉඩම<br>ඒ. එම්. විජේසිංහ මහතාගේ ඉඩම | නානා හෝටලය<br>නානා ටේලර් ෂොප්<br>රත්තොට හින්දු විද්‍යාල ඉඩම<br>ජයතිලක මහතාගේ ඉඩම<br>පෙරේරා මහතා ගේ ඉඩම<br>කොඩිප්පිලි මහාතගේ ඉඩම<br>දිසානායක මහතාගේ ඉඩම<br>ජෝෂප් මහතා ගේ ඉඩම<br>අන්නාසිවත්ත අතුරු පාර<br>වතුර ටැංකිය සහිත ස්ථානය<br>කේ. පී. සත්‍ය නාදන් මහතාගේ ඉඩම<br>පී. ජෙගනාදන් මහතාගේ ඉඩම<br>නාදන් රීටාගේ මහත්මියගේ ඉඩම<br>වජිරා මහත්මියගේ ඉඩම<br>ප්‍රගීත් වීරසේකර මහතාගේ ඉඩම |

| අංක | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ පටන් ගැන්ම හා අවසානය | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මායිම් වමට | මායිම් දකුණට |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ආරම්භයේ සිට :- | ආරම්භයේ සිට :- |
| 1 | ගොඩපොල පොල්වත්ත පාර | ගොඩපොල | මාතලේ කන්දෙනුවර ප්‍රධාන මාර්ගයේ කනත්ත අසලින් ආරම්භ වේ. මකුලේතැන්න ඇළ අසලින් නවරත්න ගොඩට පිවිසෙන ස්ථානයෙන් අවසන් වේ. | මීටර් 700 | අඩි 12 | එච්. එම්. ලොකුබණ්ඩා මයාගේ ඉඩම එච්. එම්. සෙනෙවිරත්න මයාගේ ඉඩම ආර්. එම්. රත්නායක මයාගේ ඉඩම පී. ඒ. පෙරේරා මයා ඩී. ජී. විමලරත්න මයාගේ ඉඩම් ඩී. ජී. ප්‍රේමරත්න මයා ජී. ජී. සයිමන් මයාගේ ඉඩම් ජයරත්න මයා හා ඩේවිඩ් මයාගේ ඉඩම | කැලුම් මයාගේ ඉඩම කාන්ති මියගේ රම්‍යලතා මියගේ ඉඩම ජී. ඒ. පෙරේරා මයාගේ ඉඩම් ඩී. ජී. විමලරත්න මයාගේ ඉඩම |

04-477

---

## මීගමුව මහ නගර සභාව

ගෝඝාතක ආඥාපනතේ (272අධිකාරිය) 17 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මීගමුව මහ නගර සභාවේ නගරාධිපති, එම්. එම්මානුවෙල් හර්මන් බර්නාඩ් කුරේරා වන මා විසින් 2010 වර්ෂය තුළ මෙහි පහත උපලේඛනයේ සඳහන් දිනවල සහ පළාත් සභාව සහ රජය විසින් ප්‍රකාශ කරන දිනවල මීගමුව මහා නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, මස් වෙළඳාම් කිරීම, මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන්ම තහනම් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. ඊ. එච්. බී. කුරේරා,
නගරාධිපති,
මහ නගර සභාව,
මීගමුව.

2010 ක් වූ ජනවාරි මස 01 වැනි දින,
මීගමුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

2010.01.14 තෛපොන්ගල් දිනය
2010.01.29 නවම් පුර පසළොස්වක පෝය දිනය
2010.02.04 ජාතික නිදහස් දිනය
2010.02.28 මැදින් පුර පසළොස්වක පෝය දිනය
2010.03.13 මහා සිව රාත්‍රිය
2010.03.29 බක් පුර පසළොස්වක පෝය දිනය
2010.04.28 අධි වෙසක් පුර පසලොස්වක පෝය දිනය
2010.05.27 වෙසක් පුර පසළොස්වක පෝය දිනය
2010.05.28 වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය
2010.06.25 පොසොන් පුර පසළොස්වක පෝය දිනය
2010.07.25 ඇසළ පුර පසළොස්වක පෝය දිනය
2010.08.24 නිකිණි පුර පසළොස්වක පෝය දිනය
2010.09.22 බිනර පුර පසළොස්වක පෝය දිනය
2010.10.04 ලෝක සත්ව දිනය
2010.10.22 වප් පුර පසළොස්වක පෝය දිනය
2010.11.21 ඉල් පුර පසළොස්වක පෝය දිනය
2010.12.20 උඳුවප් පුර පසළොස්වක පෝය දිනය

04-588

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.